# පළාත් සභා මැතිවරණය හා පඬියෝ

පඬියන්ට අනුව අපි ලිං මැඬියෝ වෙමු. ඔවුන්ට අනුව අපි අතීතකාමී වෙමු, නූතනත්වය ගැන කිසිවක් නො දන්නෙමු. ඇතැම් පඬියන්ට අනුව අප ජීවත්වන්නේ අතීතයේ ය, එසේත් නැතහොත් මනසින් මවාගත් ලෝකයක ය. ඒ ඔවුන්ගේ යථාර්ථයට පටහැණි ය. එහෙත් පඬියෝ එසේ නො වෙති. ඔවුහු ඉතාමත් නූතනවාදීහු වෙති. ඒත් බැරි නම් පශ්චාත්නූතනවාදීහු වෙති. ඔවුන් ජීවත්වන්නේ වර්තමානයෙහි ය. ඔවුහු යථාර්ථවාදීහු වෙති. ඔවුහු තාර්කික වෙති, බුද්ධිමත් වෙති. කෙටියෙන් කියන්නේ නම් ඔවුහු පඬියෝ ම වෙති.

මම පඬි කතා (බයිලා) ඇසීමට කැමැත්තෙමි. ඔවුහු රාජ්‍ය නොවන සංවිධානවල ද කොළඹ හා පේරාදෙණිය විශ්වවිද්‍යාලවල ද සේවය කරති. ඉන් අදහස් වන්නේ ඒ විශ්වවිද්‍යාල දෙකෙහි සියල්ලන් ම පඬියන් බවවත් අනෙක් විශ්වවිද්‍යාලවල පඬියන් නැති බවවත් නො වේ. ඒ විශ්වවිද්‍යාලවල පඬි ඝනත්වය වැඩි ය. උතුරුමැද හා සබරගමුව පළාත්සභා මැතිවරණයෙන් පසුව පඬියෝ තමන්ගේ පත්තරවලට කතාකළහ. වෙනත් වචනවලින් කියන්නේ නම් කසිකබල් සතිඅන්ත පත්තර ඔවුන්ට කතා කෙළේ ය.

පළාත් සභා මැතිවරණය ගැන පඬියන් කුමක් කියන්න ද? ඔවුන්ට නැගීමට ඇත්තේ අඳෝනා පමණකි. අනේ අපට මෙහෙම වුණේ ඇයි යනුවෙන් ඇසීම හැරෙන්නට ඔවුන්ට කළ හැක්කේ කුමක් ද? ජනතාව ජාතික මට්ටමෙන් (අප පසුගිය සතියේ කියා සිටියේ පළාත් සභා ඡන්දවල දී ජනතාව ඡන්දය පාවිච්චි කරන්නේ ජාතික මට්ටමේ ප්‍රශ්න පදනම් කරගනිමින් මිස පළාත් ප්‍රශ්න පදනම් කරගනිමින් නොවන බව ය.) මානුෂික මෙහෙයුම් අනුමත කර ඇත. ජනතාව බලා සිටින්නේ ඒ මෙහෙයුම් ඉක්මණින් ජයග්‍රහණය කරනු දැකීමට ය. ඒ සඳහා පරිත්‍යාග කිරීමට තමන් සූදානම් බව ඔවුහු පළාත්සභා ඡන්දයේ දී ප්‍රකාශ කළහ.

පඬියන්ට මේ කිසිවක් නො තේරෙයි. ඔවුන්ට අනුව කම්කරු පංතිය තම කාර්යභාරය ඉටු නො කරයි. කම්කරු පංතියක් නැති කළ කම්කරු පංතිය තම කාර්යභාරය ඉටුකරන්නේ කෙසේ දැයි පඬියෝ නො කියති. (උකුණන් ලවා ගල් අද්දවා ගත්ත ද නැති කම්කරු පංතියක් ලවා විප්ලව කරවාගත හැකි නො වේ.) එහෙත් පඬියන්ට ජනමාධ්‍ය ඇත. ඔවුන්ගේ පඬිමුවෙන් පිටවන සෑම කෙළ පිඬක් ම සුදු නෙළුම් පත්‍රයකින් පිස දැමීමට සූදානම් බීබීසී ආයතනය හා ජඩමාධ්‍ය වෙයි. අද සමාජය පඬියන් කියන දේ නොඅසන බව පැහැදිලි ය. එහෙත් පඬියෝ ඉන් අධෛර්යමත් නො වෙති. අධෛර්යමත් වීම පසුම්බිය ට ද බලපාන බව රහසක් නො වෙයි.

මෙතෙක් කල් පඬි වදන වූයේ ඊනියා යුද්ධය ජයගත නොහැකි බව ය. ඒ වදනට පසුබිම් වූයේ කිනම් ප්‍රවාදයක් දැයි අපි නො දනිමු. එහෙත් බටහිරයන්ට ද කොටි පරාජය කිරීමේ අවශ්‍යතාවක් නො වී ය. සාම්ප්‍රදායික හමුදාවකට ඊනියා ගරිල්ලා සටන් පරාජය කළ නොහැකි යැයි බටහිරයෝ ද ඔවුන් අතින් නීතිය, සාමය, ගැටුම් නිරාකරණය ආදී දහසකුත් දෑ පසුම්බි තරකරගනිමින් ඉගෙනගත් පඬියෝ ද එකහෙළා පැවසූහ. ලෝකයේ බලවත් ම රට වූ ඇමරිකානු එක්සත් ජනපදයට වියට්නාමය පැරදීමට නොහැකි වී නම් අප වැනි කුඩා රටක් ගරිල්ලා සටනින් සතුරා පරාජය කරන්නේ කෙසේ ද යන්න පඬි සාකච්ඡාවලට භාජනය විය.

පඬි සාකච්ඡා බොහෝ විට හමුදාව අධෛර්යමත් කිරීමට ද යොදාගනු ලැබිණි. 1995 මුල හමුදාවට ජයගහණය කළ හැකි යැයි පැවසුවෝ අතේ ඇඟිලි ගණනට සීමා වූහ. ඊනියා ගැටුම් නිරාකරණය පඬියන්ගේ මුවග ලෙල දෙන්නට විය. චන්ද්‍රිකා ආණ්ඩුවෙන් පඬියන්ට හමුදා භටයන් ආමන්ත්‍රණය කිරීමේ අවස්ථාව ද දෙනු ලැබිණි. පඬියන් හමුදාවට කීවේ ආයුධවලින් කොස් කොටන ලෙස ය. හමුදාවට කොටි ත්‍රස්තවාදීන් පරාජය කළ හැකි යැයි කී අයට හා ඔවුන්ගේ දරුවනට අපහාස කිරීමට පඬියෝ හා ඔවුන්ගේ ගෝල බාලයෝ ඉදිරිපත් වූහ. එකල ජනාධිපතිනිය ද පඬියනට ම සරිලන කතක් වූවා ය. ඇය ද පඬිවරියක වූ බව අමුතුවෙන් කිවයුතු නො වෙයි.

පඬියන් අද පවසන්නේ කුමක් ද? පළාත්සභා ඡන්දයෙන් එක්සත් ජනතා නිදහස් සංධානය ජයග්‍රහණය කළ බව පඬියෝ පිළිගනිති. ඒ පිළිගැනීම ම කෙතරම් දෙයක් ද? පඬියන් එසේ පිළිගත්තේ නැත්නම් කුමකින් කුමක් කරන්න ද

© Prof. Nalin De Silva

යන්න ජනාධිපති මහින්ද රාජපක්‍ෂ මහතාට  සිතාගත නොහැකි වීමට තිබුණි. ජනතා කැමැත්තට ඉඩ දී උතුරුමැද හා සබරගමුව ජයග්‍රහණය සන්ධානය අත්පත් කරගත් බව පිළිගන්නේ ද? එසේත් නැත්නම් පඬි කැමැත්තට ඉඩ දී ඒ මැතිවරණයෙන් සංධානය පරාජය වූ බව පිළිගන්න ද?

එවැනි උභතෝකෝටියකට මැදි වී නම් මහින්ද රාජපක්‍ෂ මහතාට කළ හැකිව තිබූ එකම ක්‍රියාමාර්ගය වූයේ පළාත්සභා නැවත විසුරුවා හැර ඒ පළාත්වල මැතිවරණයක් පැවැත්වීම ය. එහෙත් රටේ වාසනාවකට එතුමාට එසේ කිරීමට සිදු නො වී ය. පඬියෝ ද අරලිය ගහ මැදුරට ආරාධනයෙන් ගොස් ආරවුලක් නැති බව පැවසූහ. එහෙත් පඬියන්ට ප්‍රශ්නයක් වූයේ ජනතාව ඊනියා යුද්ධයට කැමති ද නැත් ද යන්න තීරණය කිරීම ය. ඒ ගෙදර ගියොත් අඹු නසී මග ලැග්ගොත් තෝ නසී වැන්නක් විය.

පඬියන්ට අනුව හමුදාව ඊනියා යුද්ධය ජයග්‍රහණය  කළ ද ප්‍රශ්නය වනුයේ ඉන්පසු දෙමළ ජනයාට ඇතැයි කියන ප්‍රශ්නය විසඳන්නේ කෙසේ ද යන්න ය. ඒ ප්‍රශ්නය පසුගිය දා අප රටට පැමිණි නාරායන් නම් ඉන්දීය නිලධාරියා ද අසා තිබුණි. අපි මේ පඬියන්ට එකක් කියමු. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ යුගය අවසාන වී ඇතත් තවමත් ඇගේ ගෝල බාලයෝ ප්‍රධාන තැන්වල සිටිති. එසේ වුවත් මහින්ද රාජපක්‍ෂ මහතා කොටි පැරදවීමට තීරණය කර අවසාන ය. බටහිරයන්ට එයට විරුද්ධව එතරම් දෙයක් කළ නොහැකි බව බ්ලේක් තානාපතිවරයා ද පිළිගනියි.

දැන් පඬියන් කියන්නේ මේ ආණ්ඩුවට සැබෑ ප්‍රශ්නයට විසඳුමක් නැති බව ය. ඒ ඔවුන්ගේ අළුත් කියමනක් නො වෙයි. දෙමළ ජනතාවට ඇතැයි කියන ප්‍රශ්නවලට විසඳුමක් දිය යුතු ය යන්න බොහෝ අය කියා සිටිති. එහෙත් මේ විසඳුම කුමක් දැයි පඬියෝ නො කියති. එසේ වුවත් ඔවුන්ගේ විසඳුම සංඝීය හෝ සහසංඝීය රාජ්‍යයක් හෝ බව පැහැදිළි ය. පඬියන් දැන් ඉතින්වත් ඉතිහාසයේ කසළ ගොඩේ තම තමන්ට වෙන්කර ඇති තැන් සොයාගත යුතු ය.

පඬියන්ගේ පඬි වදන් නොමැති වුව ද කළ යුත්තේ කුමක් දැයි තීරණය කිරිමේ හැකියාව ජනතාව සතුව ඇත. විසඳුම කිසිවක් නොව ඒකීය රාජ්‍යය තහවුරුකිරීම ය. මෙහි දී අමතක නොකළ යුතු කරුණක් නම් එක්සේසත් රාජ්‍යය යන්න ද ඒකීය රාජ්‍යයක් බව ය. ජාතික ව්‍යාපාරයෙහි ද පඬියෝ සිටිති. ඔවුහු එක්සේසත් රාජ්‍යය යන නම යෙදීමට විරුද්ධ වෙති. එහෙත් ලෝකයේ පැරණිම ඒකීය රාජ්‍යය ඇත්තේ ලංකාවෙහි ය. ඒ අවුරුදු දෙදහස් හාරසීයකට පෙර පඬුඅබා රජු විසින් ඇතිකරන ලද එක්සේසත් රාජ්‍යය ද ඒකීය රාජ්‍යයක් වූ බැවිනි. ලංකාවට අවශ්‍ය වන ඒකීය රාජ්‍යය එක්සේසත් රාජ්‍යයකි.

පළාත් සභා ඡන්දයේ ප්‍රතිඵල මාක්ස්වාදී විග්‍රහයකින් තේරුම්ගත නො හැකි ය. රාජ්‍ය නොවන සංවිධානවල හා කලින් සඳහන් කළ විශ්වවිද්‍යාලවල පඬියන් අමාරුවේ වැටීමට එය ද එක් කරුණකි. ආර්ථිකය මත ජාතිය යැපෙනවා යන්නට නොව ජාතිය යන්න මත ආර්ථිකය තීරණයකිරීමට ජනතාව ඡන්දය දී ඇත. මෙවර අමතක වුව ද වෙනදා පඬියෝ මෙවැනි තත්වයක් ගැන කීමේ දී අල්තුසාර් නම් බටහිර මාක්ස්වාදී පඬිවරයාගේ කසිකබල් සංකල්පයක් වූ ජාතිය අධිනිශ්චය වී ඇත යන්න යොදාගනිති. මෙහි අධිනිශ්චය යන වචනය ම වැරදිය. ඕවර්ඩිටර්මින්ඩ් යන වචනයෙහි පරිවර්තනය අධිනිර්ණිත මිස අධිනිශ්චය නො වේ. කෙසේ හෝ වේවා අධිනිශ්චය ආදිය නූතනත්වය පශ්චාත්නූතනත්වය ආදිය ගැන තමන්ට මනාදැනුමක් ඇතැයි සිතන පඬියන්ගේ යෙදුම් ය. අල්තුසාර්ගේ සංකල්පයෙන් කියැවෙන ප්‍රධාන ම කරුණ නම් මාක්ස්වාදයෙහි බංකොළොත්භාවය ය. පංතිය, ආර්ථික අධෝව්‍යුහය, උපරිව්‍යුහය ආදී සංකල්පවලින් සමාජය විග්‍රහකිරීමට නොහැකි බව තේරුම්ගත් අල්තුසාර් ඕවර්ඩිටර්මින්ඩ් යන සංකල්පය නිර්මාණය කරගත්තේ ය. ඉන් කියැවෙන්නේ නිෂ්පාදන සම්බන්ධතා නොව වෙනත් කරුණු සමාජ විකාශයෙහි දී වැදගත් වන බව ය. එහෙත් ඒ බවක් මාක්ස්වාදීහු නො කියති. පළාත්සභා මැතිවරණයෙන් කියැවෙන්නේ අද ලංකාවේ ජාතිය අධිනිර්ණිත වී ඇති බවක් නොව දෙමළ ජාතිවාදය හා සම්බන්ධ ගැටළුව ආර්ථික පදනමකට ඌනනයකිරීමට නොහැකි බව ය. බඩ වෙනුවට රට, බඩ කපා ගැනීම ආදී බයිලා කියන විවිධ වර්ගවල කසිකබල් මාක්ස්වාදීන් නොදන්නා කරුණ නම් මාක්ස්වාදයේ බඩ පමණක් නොව හිස හා හදවත ද කැපී බොහෝ කල් ගත වී ඇති බව ය. මාක්ස්වාදී පඬියන්ගේ හිස ගැන අමුතුවෙන් කිවයුතු නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva